## උපදෙස් පත්‍රිකාව

**අධ්‍යාපන කටයුතු සඳහා පිරිවෙන් හා සීලමාතා අධ්‍යාපන ආයතනවල 02 ශ්‍රේණියේ සිට පිරිවෙන් 13 ශ්‍රේණිය/ප්‍රාචීන පණ්ඩිත විභාගය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා /සීලමාතාවන්/ශිෂ්‍ය/ශිෂ්‍යාවන් වෙනුවෙන් ජනාධිපති අරමුදල මඟින් පිරිනැමෙන ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන - 2024/2025**

**සුදුසුකම්**

- පිරිවෙන් 02 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය /ප්‍රාචීන පණ්ඩිත විභාගය දක්වා ඉගෙනුම ලබන ශ්‍රේණිවල 2023 වසරේ පැවති අවසාන වාර පරීක්ෂණය අනුව 01-20 දක්වා ස්ථානයක් ලබා ගැනීම.

  සැ.යු. :- 2024 වර්ෂයේ 1 ශ්‍රේණියට ඇතුළත් වූ ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා / සීලමාතාවන් / ශිෂ්‍ය /ශිෂ්‍යාවන්ට සහ 2024 වර්ෂයේ පැවැත්වූ 2023 අ.පො.ස (සා.පෙළ) විභාගයට සහ 2023 ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයට පෙනී සිටි ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ/සීලමාතා/ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට මේ සඳහා අයදුම්කළ නොහැකි ය.
- රජයේ අනුමත පිරිවෙනක හා සීලමාතා අධ්‍යාපන ආයතනයක ඉගෙනුම ලබන ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ/සීලමාතා/ශිෂ්‍ය/ශිෂ්‍යාවක වීම.
- ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ පවුලේ මාසික ආදායම රු.100,000/- නොඉක්මවීම.

**<u>අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සහ භාර දීම.</u>**

- අයදුම්පත්‍රයේ I කොටස සහ II කොටසේ අංක 1 සිට 4 දක්වා කොටස් ශිෂ්‍යයා/ශිෂ්‍යාව විසින් සම්පූර්ණ කළ යුතු අතර ලකුණු ලබා දීම ද ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ/සීලමාතාව/ශිෂ්‍ය/ශිෂ්‍යාව විසින් ම සිදු කළ යුතු ය. අදාළ ලකුණු පිරිවෙන් /සීලමාතා අධ්‍යාපන ආයතනයේ තේරීම් කමිටුව විසින් පරීක්ෂා කර සහතික කළ යුතු ය.
- සෑම විට ම නිවැරදි තොරතුරු ඇතුළත් කළ යුතු ය.
- WhatsApp පණිවුඩ යැවීමට හැකි දුරකථන අංකයක් සඳහන් කළ යුතු ය. ඔබ වෙත එවැනි දුරකථන අංකයක් නොමැතිනම්, පවුලේ ළඟ ම ඥාතියකුගේ / පරිවේණාචාර්යවරයෙකුගේ / පරිවේණාධිපති හිමිගේ / ආයතනාධිපති හිමිගේ දුරකථන අංකයක් ඔවුන්ගේ එකඟතාවයක් සහිතව ලබා දීමට කටයුතු කළ යුතු ය.

ගිහි සිසු/සිසුවියන් පවුලේ ආදායම් තත්ත්වය පිළිබඳ ව තමන් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගේ සහතිකය ද ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයද (ආදායම් වාර්තාවක් ලබා ගැනීම අවශ්‍ය නොවේ) සමඟින් **සම්පූර්ණ කරන ලද අයදුම්පත තම පිරිවෙනේ / සීලමාතා අධ්‍යාපන ආයතනයේ පරිවේනාධිපති / ආයතනාධිපති වෙත පමණක් භාර දිය යුතු ය.**

| |
|---|
| පරිවේණාධිපති/ආයතනාධිපති විසින් තම පිරිවෙනට උපරිම ශිෂ්‍යත්වලාභීන් ගණන තෝරාගත් බව දැනුම් දුන් පසු එම ශිෂ්‍යත්ව ලාභියාගේ මව/පියා/භාරකරුගේ හවුල්කාරීත්වයෙන් යුතුව පවතින මාසිකව ශිෂ්‍යාධාර ලබාගත හැකි (විශේෂ බද්ධ ගිණුමක්) සක්‍රිය ගිණුමක් මහජන බැංකුවේ, ලංකා බැංකුවේ හෝ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ශාඛාවකින් විවෘත කර, එම ගිණුමේ තොරතුරු සඳහන් පිටුවේ සහ මව/පියා/ භාරකරුගේ ජාතික හැඳුනුම්පතහි පැහැදිලි ඡායාපිටපතක් පරිවේණාධිපති /ආයතනාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එම ඡායාපිටපත් පරිවේණාධිපති/ආයතනාධිපති විසින් සහතික කළ යුතු ය.<br><br>සැ.යු. කෙසේ වුවද පරිවේණාධිපති /ආයතනාධිපති විසින් ශිෂ්‍යත්ව ලාභියකු ලෙස තෝරාගත් බව දන්වන තෙක් බද්ධ ගිණුමක් විවෘත කිරීමට අවශ්‍ය නැත. |

- කිසිදු අවස්ථාවක අයදුම්පත් ජනාධිපති කාර්යාලයට හෝ ජනාධිපති අරමුදල වෙත ගෙනවිත් භාර දීම හෝ තැපැල මඟින් යොමු නොකළ යුතු ය.

## 1. ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ / සීලමාතාව / ශිෂ්‍ය / ශිෂ්‍යාවන්ගේ කාර්ය සාධනය

1.1. ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ/ සීලමාතාව/ ශිෂ්‍යයා/ ශිෂ්‍යාව 2023 (2024) වර්ෂයේ පැවති අවසාන වාර පරීක්ෂණයේ දී ලබා ගෙන ඇති ස්ථානය.

සැ.යු. :-

- පිරිවෙන්/සීලමාතා අධ්‍යාපන ආයතන තුළ 02 ශ්‍රේණියේ සිට 04 ශ්‍රේණිය දක්වා, 06 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා සහ උසස් පෙළ සහ ප්‍රාචීන අවසාන විභාගය දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ/ සීලමාතාවන් / ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් විය යුතු ය.

| | |
|---|---|
| 01 වන ස්ථානය සිට 03 වන ස්ථානය දක්වා | ලකුණු 70 |
| 04 වන ස්ථානය සිට 06 වන ස්ථානය දක්වා | ලකුණු 65 |
| 07 වන ස්ථානය සිට 10 වන ස්ථානය දක්වා | ලකුණු 60 |
| 11 වන ස්ථානය සිට 15 වන ස්ථානය දක්වා | ලකුණු 55 |
| 16 වන ස්ථානය සිට 20 වන ස්ථානය දක්වා | ලකුණු 50 |
| (උපරිම ලකුණු 70) | |

1.2. 02 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සහ ප්‍රාචීන ප්‍රාරම්භ පංතියේ සිට ප්‍රාචීන අවසාන පංතිය දක්වා පංතිවල ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා/ සීලමාතාවන් හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා පමණි.

| | | |
|---|---|---|
| විශිෂ්ට සාමාර්ථයක් සඳහා | (A) | ලකුණු 08 |
| අධි සම්මාන සාමාර්ථයක් සඳහා | (B) | ලකුණු 06 |
| සම්මාන සාමාර්ථයක් සඳහා | (C) | ලකුණු 05 |
| සාමාන්‍ය සාමාර්ථයක් සඳහා | (S) | ලකුණු 04 |

1.1. විෂය සමගාමී ක්‍රියාකාරකම්

**පිරිවෙන් මට්ටමින් ක්‍රියාත්මක අන්තර් පාරිවේණික භාෂා හා සාහිත්‍ය (අන්තර් පාරිවේණික සිසු නිපුණතා ඇගයීම) තරඟ/ ක්‍රීඩා ජයග්‍රහණ (කේවල / සමූහ) විෂය සමගාමී (සමිති, සමාගම් යනාදිය ඇතුළත් ව) ආදිය සහ වෙනත් අනුමත විෂය සමගාමී ක්‍රියාකාරකම් වලට අදාළ ජයග්‍රහණ**

| | පිරිවෙන්/ සීලමාතා අධ්‍යාපන ආයතන මට්ටම | කලාප මට්ටම | පළාත් මට්ටම | ජාතික මට්ටම |
|---|---|---|---|---|
| පළමුවන ස්ථානය | 07 | 08 | 09 | 10 |
| දෙවන ස්ථානය | 06 | 07 | 08 | 09 |
| තුන්වන ස්ථානය | 05 | 06 | 07 | 08 |

(උපරිම ලකුණු 10)

සැ.යු. :-

- එක් අවුරුද්දකට පමණක් ලකුණු ලබා දීමට යටත් ව, ආසන්න පසුගිය වසර 03 ක් සලකා බැලීම සුදුසු ය.
- ඉහත 1.2 හි දී, එක් ශිෂ්‍යත්ව අපේක්ෂකයෙකුට එක ම විෂය සමගාමී ක්‍රියාකාරකමක් සඳහා ජාතික, පළාත්, කලාප සහ පාසල් යන මට්ටම් තුනේ ම අනුයාත වසර 03කට අදාළ ව ජයග්‍රහණ පවතී නම් ලකුණු දීමේ දී සැලකිල්ලට ගත යුත්තේ ඉහළ ම ලකුණු මට්ටම පමණි.

**3. <u>ශිෂ්‍ය නායකත්වය - සියලු ශ්‍රේණි සඳහා</u>**

| | |
|---|---|
| පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායක / උප ප්‍රධාන ශිෂ්‍ය නායක | ලකුණු 15 |
| ශිෂ්‍ය නායක (ජ්‍යෙෂ්ඨ/කනිෂ්ඨ ) | ලකුණු 12 |
| පන්ති නායක | ලකුණු 10 |

(උපරිම ලකුණු 15)

**සැ.යු. :-** ඉහත 03 හිදි ලකුණු දීමේ දී සැලකිල්ලට ගත යුත්තේ ඉහළ ම මට්ටම් පමණි.

**4. <u>ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ/ සීලමාතාව/ ශිෂ්‍යයා/ශිෂ්‍යාව දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම / දහම් පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සිදු කිරීම.</u>**

**(දහම් පාසල් ප්‍රධානාචාර්ය විසින් නිකුත් කළ සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.)**

| | |
|---|---|
| දහම් පාසල් අධ්‍යාපනය හැදෑරීම.<br>(වසරකට වැඩි කාලයක් දහම් අධ්‍යාපනය ලැබීම සහ මේ වන විටත් දහම් පාසලක ශිෂ්‍ය ශිෂ්‍යාවක ලෙස කටයුතු කිරීම.) | ලකුණු 05 |
| දහම් පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සිදු කිරීම | ලකුණු 05 |
| (උපරිම ලකුණු 05) | |

- සියලු ලියාපදිංචි ආගමික දහම් පාසල් මේ යටතට අයත් වේ.
-

**5. <u>ලකුණු සාරාංශය</u>**

- ඉහත 1 සිට 4 දක්වා සියලු කොටස් වලට ලබා ගත් උපරිම ලකුණු ප්‍රමාණයන් ඊට අදාල කොටස තුළ සාරාංශගත කොට ඉදිරිපත් කළ යුතු ය.

**ඔබට තවදුරටත් තොරතුරු දැනගැනීමට අවශ්‍ය නම් පහත සඳහන් විද්‍යුත් ලිපිනයට (Email) පණිවිඩයක් යොමු කිරීම මඟින් හෝ දුරකථක අංක වෙත ඇමතුමක් ලබා දීම මඟින් සිදු කළ හැකි ය.**


**විද්‍යුත් ලිපිනය (Email) :-** pfschol@presidentsoffice.lk

**011 -2 354 354 - දිගු අංක :- 4830/ 4835/ 4837**

**074 - 085 4527 (WhatsApp මඟින් යොමු වන පණිවුඩ පමණි )**